# සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ පාසල්වල 11 වන ශ්‍රේණියේ ඉතිහාසය විෂයය ඉගැන්වීමෙහි නිරත ගුරුවරුන් භාවිත කරන ඉගැන්වීම් ක්‍රම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් යන මෙම පර්යේෂණය සඳහා සමීක්ෂණ පර්යේෂණ පිරිසැලසුම තෝරා ගන්නා ලදි. මෙම පර්යේෂණය අරමුණු 5ක් ඔස්සේ දිශා ගත කරන ලදි. එනම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී භාවිත කරන විවිධ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගුරුවරුන්ගේ දැනුවත් භාවය විමසා බැලීම, 11 වන ශ්‍රේණියේ ඉතිහාසය විෂයය උගන්වන ගුරුවරුන් භාවිත කරන ඉගැන්වීම් ක්‍රම අනාවරණය කර ගැනීම, ගුරුවරුන් යොදා ගන්නා ඉගැන්වීම් ක්‍රම පිළිබඳ සිසු සංජානනය විමසා බැලීම, ඉතිහාසය විෂයය ඉගැන්වීම සඳහා විවිධ ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීමේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලු විමසා බැලීම, ගුරුවරුන් යොදා ගන්නා ඉගැන්වීම් ක්‍රම සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම යන අරමුණුයි.

දත්ත රැස් කිරීමට සිසු, ගුරු, විදුහල්පති, ගුරු උපදේශක සහ විෂයය අධ්‍යක්ෂ යන කාණ්ඩ නියැදිය සඳහා තෝරා ගත් අතර සිසු නියැදිය කැකිරාව අධ්‍යාපන කලාපයේ 1AB පාසලක්, 1C පාසල් දෙකක්, සහ 2 වර්ගයේ පාසල් දෙකක් මගින් සිසුන් 100ක් සරල අහඹු නියැදි ක්‍රමයෙන් තෝරා ගන්නා ලදි. එසේම මෙම පාසල්හි විදුහල්පතිවරුන් අදාළ නියැදිය සඳහාත් කලාපයේ සේවය කරන ඉතිහාසය විෂයය ඉගැන්වීමෙහි නිරත ගුරුවරුන් ගුරු නියැදිය සඳහාත් කලාපයේ ගුරු උපදේශක සහ විෂයය අධ්‍යක්ෂ ද තෝරා ගන්නා ලදි.

ප්‍රශ්නාවලී මගින් ගුරු සිසු දෙපාර්ශ්වයෙන් ප්‍රමාණාත්මක දත්ත ලබා ගත් අතර විදුහල්පති, ගුරු උපදේශක සහ විෂය අධ්‍යක්ෂ යන නියැදියෙන් සම්මුඛ සාකච්ඡා පවත්වමින් ගුණාත්මක දත්ත ලබා ගන්නා ලදි.

රැස් කර ගත් දත්ත වගු ප්‍රස්තාර ප්‍රතිශත ඇසුරින් ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ද විශ්ලේෂණය කරන ලදි. ඒ අනුව පහත සඳහන් නිගමනයන්ට එළඹිනි. ඉතිහාසය විෂයයට කැමැති නිසා ඉගැන්වීමෙහි නිරතවන බව, ඉතිහාසය විෂයය තුළින් ඓතිහාසික තොරතුරු දැන ගත හැකි බව, අනිවාර්ය විෂයන්ගෙන් වඩාත් කැමති විෂයය ගණිතය බව, ඉතිහාසය ඉහැන්වීම සඳහා වැඩි වශයෙන් සාකච්ඡා ක්‍රමය භාවිත කරන බව, විවිධ ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගුරුවරුන්ගේ දැනුවත් භාවය අවම මට්ටමක පවතින බව, ඉතිහාසය විෂයය ඉගැන්වීමෙහි නිරත ගුරුවරුන්ගෙන් වැඩි පිරිසකට විශේෂ පුහුණුවක් නොමැති බව, කලාප

කාර්යාල මඟින් ලබා දෙන සේවාස්ථ වැඩසටහන්වලට ගුරුවරුන්ගේ සහභාගිත්වය සතුටුදායක මට්ටමක පවතින බව, විවිධ ඉගැන්වීම් ක්‍රම පිළිබඳව පුහුණුවක් ලබා ගැනීමට ගුරුවරුන් දැඩි කැමැත්තක් දක්වන බව, සාධන මට්ටම ඉහළ යාමට විවිධ ඉගැන්වීම් ක්‍රම භාවිතය හේතු වන බව, ඉතිහාසය විෂයයට වෙන්ව තිබෙන කාලච්ඡේද ප්‍රමාණවත් නොවීම සහ විෂයය නිර්දේශය පුළුල් වීම ගුරුවරුන් මුහුණදෙන ගැටලු බව, විවිධ ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීමේ දී පාසල ආශ්‍රිතව ගැටලුවලට ගුරුවරුන් මුහුණදෙන බව, ඉතිහාසය ඉගෙන ගැනීමේ දී සිසුන් ප්‍රායෝගික ඉගැන්වීම් ක්‍රමවලට වඩාත් කැමති බව, ඉතිහාසය විෂයය සාර්ථකව ඉගැන්වීමට ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීම සහ ඉගෙනුම් ආධාරක භාවිත කළ යුතු බව යන්නයි.

ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ක්‍රම භාවිත කිරීම, විෂයය දැනුම සංවර්ධනය කර ගැනීම, ඉගැන්වීම් ක්‍රම පිළිබඳ පුහුණුව යාවත්කාලීන කිරීම, කලාප මට්ටමින් විෂයය ප්‍රවර්ධන කටයුතු සංවිධානය කිරීම, විෂයය ඉගැන්වීමට කාලච්ඡේද සංඛ්‍යාව වැඩි කිරීම සහ විෂයයට අදාළ අතිරේක කියවීම් පොත් මුද්‍රණය කර බෙදා හැරීම යෝජනා ලෙස ඉදිරිපත් කර ඇත.